" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / பொது தொலைபேசி / General Telephone - 011 - 2093000

ISO 9001
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/FIN-AP/03/FI/18(A) | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2025.01.16 |

## මූල්‍ය චක්‍රලේඛ අංක 02/2025

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තු වල ප්‍රධානීන් (බ.ප.),
ව්‍යවස්ථාපිත අධිකාරි වල සභාපතිවරු (බ.ප.),

### රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය
### රාජ්‍ය ආයතනවල පවතින විශාල වැය බරක් වන සුඛෝපභෝගී වාහන රජයේ ප්‍රසම්පාදන ක්‍රමවේදයට අනුව අපහරණය කිරීම

භාණ්ඩාගාර ලේකම්ගේ 2024.12.18 දිනැති "රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය රාජ්‍ය ආයතනවල පවතින විශාල වැය බරක් වන සුඛෝපභෝගී වාහන රජයේ ප්‍රසම්පාදන ක්‍රමවේදයට අනුව අපහරණය කිරීම" සම්බන්ධයෙන් නිකුත් කරන ලද වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2024 හි පිටපතක් මේ සමඟ අමුණා ඇත.

02. ඉහත චක්‍රලේඛය බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක: GOS/ADM/6/2/19 හා 2025.01.08 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇත. එහෙයින් මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

එස්.එල්. ධම්මිකා කේ. විජයසිංහ,
ප්‍රධාන ලේකම්,
පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් හා
පළාත් භාණ්ඩාගාර ලේකම්
බස්නාහිර පළාත.

| | | |
|---|---|---|
| දුරකතන | : | 0112-093416 |
| ෆැක්ස් | : | 0112-092636 |
| විද්‍යුත් ලිපිනය | : | accpay@cs.wpc.gov.lk |

පිටපත: 01.විගණකාධිපති
02.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
03.තොරතුරු තාක්ෂණ නිලධාරී


| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதம செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මුදල් / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණක / பிரதம உள்ளகக் கணக்காய்வாளர் / Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel : 0112092606 Fax : 0112092609 dcsadmin@cs.wpc.gov.lk | Tel : 0112092631 Fax : 0112092647 | Tel : 0112092640 Fax : 0112092636 | Tel : 0112092532 Fax : 0112092533 | Tel : 0112092501 Fax : 0112092505 | Tel : 0112092628 Fax : 0112092625 |

# මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
# MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01.
ශ්‍රී ලංකාව

செயலகம், கொழும்பு 01.
இலங்கை.

The Secretariat, Colombo 01.
Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| කාර්යාලය<br>அலுவலகம்<br>Office | 011 - 2484500<br>011 - 2484600<br>011 - 2484700 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011 - 2449823 | වෙබ් අඩවිය<br>இணையத்தளம்<br>Website | www.treasury.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | CGO/ASM/Policy/Cir/ (VOL III) | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 18.12.2024 |

**වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2024**

**සියලුම:** **අමාත්‍යාංශ ලේකම්වරුන්**
**පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්**
**දෙපාර්තමේන්තු ප්‍රධානීන්**
**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සභාපති සහ විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්**
**රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්**
**රාජ්‍ය බැංකු හා රාජ්‍ය සමාගම් සභාපතිවරුන්**

**රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය**

**රාජ්‍ය ආයතනවල පවතින විශාල වැය බරක් වන සුඛෝපභෝගී වාහන රජයේ ප්‍රසම්පාදන ක්‍රමවේදයට අනුව අපහරණය කිරීම**

පොදු දේපළ අස්ථානගත වීම සහ අවභාවිතය වැළැක්වීමට මෙන්ම රජයේ මුදල් ඵලදායී ලෙස යොදා ගැනීම තහවුරු කිරීම සඳහා, රජයේ සියලුම වාහන නිසි පරිදි උපයෝජනය කිරීම, ලේඛනගත කර පවත්වා ගැනීම හා වාර්තා කිරීම, සියලුම රාජ්‍ය ආයතනවල (රජයේ ආයතන, රාජ්‍ය ව්‍යාපාර සහ පළාත් සභා හා පළාත් පාලන ආයතන) ප්‍රධානීන්ගේ අනිවාර්ය කාර්යයක් වේ.

02. 2024 දෙසැම්බර් 02 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අංක 24/2096/801/004 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබ ඇති තීරණය අනුව, සියලුම රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ විෂය පථය යටතේ ඇති රජය සතු වාහන අපහරණය කිරීම සඳහා පහත සඳහන් උපදෙස් පරිදි කටයුතු කළ යුතු වේ:

i. (අ.) අදාළ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා / ගණන් දීමේ නිලධාරියා විසින්, ආයතනයේ මෝටර් වාහන අවශ්‍යතාවය පිළිබඳව ඇගයීමක් සිදු කිරීමෙන් අනතුරුව, පහත (ii) හි නිශ්චිතව සඳහන් කර ඇති භාවිතය ආර්ථිකමය වශයෙන් ඵලදායී නොවන / ආයතනයේ භාවිතය සඳහා අවශ්‍ය නොවන මෝටර් වාහන, රජයේ ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කර, අපහරණය කිරීමට කටයුතු කර අදාළ තොරතුරු 2025 මාර්තු 01 දිනට පෙර රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතිය (NFAMS) හි වාර්තා වාර්තා කළ යුතු වේ.

(ආ) පහත (ii) හි දැක්වෙන පරිදි වර්ගීකරණය කරන ලද මෝටර් වාහන අතුරින් අදාළ ආයතනයේ භාවිතය සඳහා මෝටර් වාහන අවශ්‍ය වන්නේ නම්, මේ සමග වන ඇමුණුම I හි සඳහන් ආකෘතිය අනුව සකස් කරන ලද එම වාහනවල විස්තරද සමග එම අවශ්‍යතාවය

සාධාරණීකරණය කරමින්, අදාළ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා / ගණන් දීමේ නිලධාරියා විසින් භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීම සඳහා 2024 දෙසැම්බර් 31 දිනට පෙර කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු වේ. එම තොරතුරු අදාළ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා / ගණන් දීමේ නිලධාරියා විසින් සහතික කළ යුතු අතර එසේ කළ නොහැකි විශේෂිත අවස්ථාවන්වලදී ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා / ගණන් දීමේ නිලධාරියා වෙනුවෙන් ආයතනයේ පරිපාලන කටයුතු පිළිබඳව වගකීම දරනු ලබන අදාළ ඉහලම නිලධාරියා විසින් නිසි ලෙස සහතික කළ යුතු වේ.

ii රේගු ආඥා පනතේ (අ) උපලේඛනය මගින් ප්‍රකාශිත සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ (HS) 87.03 යටතේ වර්ගීකරණය කර ඇති, එන්ජින් ධාරිතාවය 1800 CC ට වැඩි පෙට්‍රල් වාහන / එන්ජින් ධාරිතාවය 2300 CC ට වැඩි ඩීසල් වාහන (ඩබල් කැබ්, සිංගල් කැබ්, වෑන්, බස්, ලොරි හා ට්‍රක් ආදිය මෙම සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ යටතට අයත් නොවන බව කාරුණාවෙන් සලකන්න).

iii. ඉහත සඳහන් කර ඇති අපහරණ ක්‍රියාවලිය තුලින් වාහන මිලදී ගැනීම කිසිඳු රාජ්‍ය ආයතනයක් විසින් සිදු නොකල යුතු වේ.

03. සෑම රාජ්‍ය ආයතනයකම පවතින, ඉහත 02 (ii) හි නිශ්චිතව සඳහන් කර ඇති සියලුම වාහනවල අදාළ තොරතුරුවල දෘඪ පිටපත, 2024 දෙසැම්බර් 31 දිනට පෙර, මේ සමග වන ඇමුණුම II අනුව, කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත දැන ගැනීම පිණිස ඉදිරිපත් කළ යුතු වේ. ඉහත 02 (i) (ආ) හි සඳහන් පරිදි එම තොරතුරු නිසි පරිදි සහතික කළ යුතු වේ. එම තොරතුරු 011-2151417 දරණ ෆැක්ස් අංකය මගින් හා එහි මෘදු පිටපත (MS Excel), cgo@mo.treasury.gov.lk ලිපිනයට විද්‍යුත් තැපැල මගින්ද කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු වේ. කිසියම් රාජ්‍ය ආයතනයකට ඉහත 02 (ii) හි නිශ්චිතව දක්වා ඇති වාහන නොමැති නම්, හිස් වාර්තාවක් (Nil report) ඉදිරිපත් කළ යුතු වේ.

04. ධාවන තත්වයේ නොපවතින වාහන අපහරණය කිරීම සහ වාහන නිසි පරිදි භාවිතා කිරීම:

i. ඉහත විධිවිධානවලට අමතරව, වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2022 මගින් උපදෙස් ලබා දී ඇති පරිදි, මෙම පොදු දේපළ විනාශ වීම සහ රජයේ ආදායම අහිමිවීම වැළැක්වීම පිණිස, වාහන නිසි පරිදි නඩත්තු කිරීම සහ නොසැලකිලිමත් භාවිතය වැළැක්වීම මගින් මෙන්ම අදාළ චක්‍රලේඛ උපදෙස් අනුගමනය කරමින් අවශ්‍ය පරිදි නිසි කලට වාහන අපහරණය කිරීම මගින්, වාහන නිසි පරිදි භාවිතා කිරීම තහවුරු කිරීම පිණිස අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම සියලුම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ / ගණන්දීමේ නිලධාරීන්ගේ අනිවාර්ය කාර්යයක් බව තවදුරටත් අවධාරණය කෙරේ.

ii. වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2020 සහ අංක 04/2022 මගින් ලබා දී ඇති උපදෙස් අනුව ධාවන තත්වයේ නොපවතින වාහන අපහරණය කිරීමේ ක්‍රියාවලිය මෙතෙක් අවසන් කර නොමැති සියලුම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් / ගණන්දීමේ නිලධාරීන්, එම වාහන අපහරණය කිරීමේ ක්‍රියාවලිය අවසන් කර අදාළ තොරතුරු NFAMS හි වාර්තා කිරීමට වහාම කටයුතු කළ යුතු වේ.

05. වාහන අපහරණය කිරීමෙන් ලැබෙන ආදායම වාර්තා කිරීම:

වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2020 හි 02(අ) වගන්තියේ සඳහන් උපදෙස් පරිදි වාහන අපහරණය කිරීමෙන් ලැබෙන ආදායම වාර්තා කළ යුතු වේ.

06. වාහන අපහරණය කිරීම සහ ලියාපදිංචි අයිතිය අවලංගු කිරීම / පැවරීම:

i. වාහනයක් අබලි ද්‍රව්‍ය ලෙස අපහරණය කරන්නේ නම්, වාහනය අපහරණය කිරීමට පෙර, එහි ලියාපදිංචි අයිතිය අවලංගු කිරීමට, අදාළ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා / ගණන් දීමේ නිලධාරියා වගකිව යුතු වේ.

ii. වාහනයක් අබලි ද්‍රව්‍ය නොවන ලෙස අපහරණය කරන්නේ නම්, අපහරණය කළ දින සිට මාස හයක් (06)ක් ඇතුලත වාහනයේ ලියාපදිංචි අයිතිය පැවරීමට, අදාළ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා / ගණන් දීමේ නිලධාරියා වගකිව යුතු වේ.

07. NFAMS වෙත පිවිසීමට සහ චක්‍රලේඛ පරිශීලනය කිරීම සඳහා, පහත දක්වා ඇති QR කේතය පරිලෝකනය (scan) හෝ https://systems.treasury.gov.lk වෙබ් පිවිසුම භාවිතා කිරීම සිදු කරන්න. වැඩිදුර පැහැදිලි කර ගැනීම් සඳහා: nfams@mo.treasury.gov.lk හරහා ඉල්ලීම් ඉදිරිපත් කල හැකි වේ. දුරකථන අංක: 011-2484583, 011-2151425.

අත්.කළේ / කේ.එම්.මහින්ද සිරිවර්ධන

භාණ්ඩාගාර ලේකම්

SCAN HERE TO LOGIN NFAMS

පිටපත්:
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. කොමසාරිස් ජනරාල්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
5. විගණකාධිපති

# Annexure- I

## Vehicles required for the use of the Institution

**Petrol vehicles exceeding Engine Capacity 1800 CC / Diesel vehicles exceeding Engine Capacity 2300 CC**

which are classified under the H S Heading 87.03 published in the Schedule A of the Customs Ordinance
(Please note that, Double Cabs, Single Cabs, Vans, Buses, Lorries and Trucks etc. are not included to this H S Heading)

*A duly filled and certified copy should be faxed to 011-2151417 and email the soft copy (MS Excel) to cgo@mo.treasury.gov.lk*

**Name of the Institution -**

| No | Vehicle No *(Ex: KA-0001/ 32SRI0001/ 19-0001)* | Purpose (Assigned/ Pool) | If Assigned | | Justification for the requirement of Use |
|---|---|---|---|---|---|
| | | | Name of the Officer | Designation | |
| 1 | | | | | |
| 2 | | | | | |
| 3 | | | | | |
| 4 | | | | | |
| 5 | | | | | |

**Certified Officer : Name -**
**Designation -**
**Contact No -**
**Official Stamp -**

# Annexure- II

## All the Vehicles under the Institution

**Petrol vehicles exceeding Engine Capacity 1800 CC / Diesel vehicles exceeding Engine Capacity 2300 CC**

which are classified under the H S Heading 87.03 published in the Schedule A of the Customs Ordinance
(Please note that, Double Cabs, Single Cabs, Vans, Buses, Lorries and Trucks etc. are not included to this H S Heading)

*A duly filled and certified copy should be faxed to 011-2151417 and email the soft copy (MS Excel) to cgo@mo.treasury.gov.lk*

**Name of the Institution -**

| No | Vehicle No *(Ex: KA-0001/ 32SRI0001/ 19-0001)* | Make *(Ex:Toyota/ BMW)* | Model *(Ex:Land Cruiser V8/ X5)* | Year of Manufacture | Name of the Owner *(as mentioned in the Certification of Registration)* |
|---|---|---|---|---|---|
| 1 | | | | | |
| 2 | | | | | |
| 3 | | | | | |
| 4 | | | | | |
| 5 | | | | | |

**Certified Officer : Name -**
**Designation -**
**Contact No -**
**Official Stamp -**

Soft copy of these Annexures is available with this Circular in the website as given in the Section 07 of this Circular.